# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2481/18 - 2026 මාර්තු මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2026.03.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.4/2007(I)ඇ

**1961 අංක 31 දරන ආයුර්වේද පනත**

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 19 සහ 50 වන වගන්තිය සමග කියවිය යුතු 18 වගන්තියේ (ඊ) ඡේදය යටතේ ආයුර්වේද වෛද්‍ය සභාව විසින් සාදන ලද රීති.

(ලේඛකාධිකාරි),
ආයුර්වේද වෛද්‍ය සභාව.

2026 මාර්තු මස 20 වන දින,
කොළඹ දී ය.

රීති

1. 2014 ඔක්තෝබර් මස 15 වන දින අංක 1884/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2014 අංක 01 දරන ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ (වෘත්තීමය චර්යා) රීති පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වන රීතියට ඉක්බිතිවම 2අ රීතිය වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන් :-

"2අ. ආයුර්වේද වෛද්‍යවරයකුගේ නිල මුද්‍රාවෙහි-

(අ) එකී වෛද්‍යවරයාගේ ලියාපදිංචි කිරීමේ අංකය :
(ආ) එකී වෛද්‍යවරයාගේ තනතුරු නාමය; සහ
(ඇ) ආයුර්වේද වෛද්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ වෘත්තීය සුදුසුකම්;

පමණක් අන්තර්ගත විය යුතුය." සහ

1A - G 46512 — 04 (2026/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එහි 10 වන රීතිය ඉවත්කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"10. සෑම ආයුර්වේද වෛද්‍යවරයකු විසින් ම සෑම අවුරුදු පහකට වරක්-

(අ) ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් වූ තම ලියාපදිංචිය; සහ
(ආ) එම ලියාපදිංචි කිරීම සඳහා සාක්ෂියක් වශයෙන් තමා වෙත නිකුත් කර ඇති හැඳුනුම්පත,

අලුත් කරනු ලැබිය යුතුය."

2. මෙම රීති බලාත්මක වීම නොසලකා හරිමින්, මෙම රීති පළ කරනු ලබන අවස්ථාවේ දී වලංගුව පවතින්නා වූ 1961 අංක 31 දරන ආයුර්වේද පනත ප්‍රකාරව ලබාගෙන ඇති ආයුර්වේද වෛද්‍යවරයකුගේ සෑම ලියාපදිංචියක්ම හෝ 2014 ඔක්තෝබර් මස 15 දින අංක 1884/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2014 අංක 01 දරන ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ (වෘත්තීමය චර්යා) රීති ප්‍රකාරව අලුත්කරන ලද ආයුර්වේද වෛද්‍යවරයකුගේ සෑම ලියාපදිංචියක් ම අදාළ වලංගු කාලසීමා තුළ දී අඛණ්ඩව වලංගුව පැවතිය යුතු වේ.

EOG 03 - 0211

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.